ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk

# පාරිවේණික අධ්‍යාපනය

පාරිවේණික අධ්‍යාපන ආයතන ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් ඇති ආගමික වශයෙන් සංස්කෘතික වශයෙන් ධර්මශාස්ත්‍රීය වශයෙන් අති විශිෂ්ට සේවාවක් කළ බෞද්ධ ආරාමික මධ්‍යස්ථාන ලෙස සැලකිය හැකිය. ක්‍රි.පූ. තුන් වන සියවසේ ලක්දිව සම්බුද්ධශාසන ප්‍රතිෂ්ඨාපනයත් සමග ආරම්භ වූ මෙම ආරාමික බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන වර්තමානය දක්වා වසර දෙදහසක පමණ දීර්ඝ කාල පරිච්ඡේදයක් අඛණ්ඩව පවත්වාගෙන ඒමේ ගෞරවය හිමිවිය යුත්තේ ලක්දිව භික්ෂු මහා සංඝයා වහන්සේටය. ධර්මවිනයධර බහුශ්‍රැත භික්ෂූන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වයෙන් පවත්වාගෙන ආ පිරිවෙන් අධ්‍යාපන ආයතන ගිහිපැවිදි දෙපක්ෂයේ ම ධර්මශාස්ත්‍රීය ඥනයත් ආධ්‍යාත්මික පෝෂණයත් ඇති කිරීමෙහි ලා උපරිම සේවාවක් ඉටු කර තිබේ. අප මාතෘභූමියේ ස්වාධීනත්වය ආරක්ෂා කරගෙන ජනතාවගේ උභය ලෝකාර්ථ සිද්ධිය ළඟා කර දෙමින් දස රාජ ධර්මයෙන් රාජ්‍ය පාලනය කළ හැම රාජ්‍ය පාලකයකුගේ ම පූර්ණ අනුග්‍රහය ලැබූ මෙම පාරිවේණික අධ්‍යාපන ආයතන ජාතියේ පරිහානිය ඇතිවූ අවස්ථාවන්හි දුර්වල තත්වයට පත් වූ අයුරු ද ඓතිහාසික සාධක අනුව පැහැදිලි වේ. එබඳු අභාග්‍යසම්පන්න අවස්ථාවන්හි දෛවෝපගත සිද්ධි මහිමයෙන් මෙන් පහළ වූ ශ්‍රේෂ්ඨ සංඝපිතෘවරුන්ගේ හා රාජ්‍ය පාලකයන්ගේ අත්‍යුදාර සේවාවන් කරණකොට ගෙන මෙම අමරණීය ජාතික ආගමික අධ්‍යාපන ආයතන පුනර්ජීවය ලබා මල්පල ගැන්වුණු අයුරු ද එසේම දෘශ්‍යමාන වේ.

සෙංකඩගල රාජධානි සමයෙහි බෝධිසත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික සරණංකර සංඝරාජ මාහිමියන් වහන්සේගේ ශ්‍රී නාමය මෙහිලා නිදසුනක් ලෙස දැක්විය හැකිය. අභාවයට පත්ව තිබුණු ප්‍රාචීන භාෂාශාස්ත්‍ර ප්‍රදීපය යළි දැල්වීමට අති මහත් දුෂ්කරතා මධ්‍යයේ සරණංකර සංඝරාජ මාහිමියන් ගත් වෑයම සදානුස්මරණීය උදාර ශාසනික මෙහෙවරක් ලෙස අගය කළහැකිය.

වැලිවිට පිණ්ඩපාතික සරණංකර සංඝරාජ මාහිමියන් විසින් දල්වන ලද ධර්ම ශාස්ත්‍ර ප්‍රදීපය වඩ වඩාත් දීප්තිමත් ව බැබළුණේ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමිපාණන් විසින් 1873 වසරෙහි මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කිරීමත් රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මාහිමිපාණන් වහන්සේ විසින් 1874 වසරෙහි පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කිරීමත් නිසාය. එහෙත් මෙහිලා අප විසින් අමතක නොකළයුතු තවත් වැදගත් කරුණක් නම් ශ්‍රී සුමංගල, ධර්මාලෝක මාහිමිපාණන් වහන්සේ දෙනමගේ ගුරුභූමිය වූ රත්මලානේ පරම ධම්මචේතිය පරිවේණස්ථානයත් එම ඓතිහාසික විද්‍යාස්ථානයෙහි එවකට ආධිපත්‍යය ඉසිලූ දිසාපාමොක් ආචාර්යවරයකු වශයෙන් සුප්‍රකට කීර්තියක් දැරූ උදාර චරිතයෙන් උපසෝභිත මහා පණ්ඩිත රත්නයක් වූ වළානේ ශ්‍රී සිද්ධාර්ථාභිධාන මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේත්ය.

විද්‍යොදය විද්‍යාලංකාර පිරිවෙන් ආරම්භ වීමත් සමග එම දෙපිරිවෙනෙන් ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය ලැබූ භික්ෂූන් වහන්සේ ලක්දිව නොයෙක් පළාත්වල ස්වකීය විහාරස්ථානයන්හි පිරිවෙන් අධ්‍යාපන ආයතන ආරම්භ කළහ.

1902 වර්ෂයේ ලංකාවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වූ එස්. එම්. බරෝස් මහාත්මා විසින් එම අවදියෙහි සිටි ගිහි පැවිදි ප්‍රාචීන පඬිවරයන්ගේ සහාය ලබා ගෙන ලක් රජයේ ද අනුග්‍රහය ඇතුව කොළඹ ප්‍රාචීන භාෂොපකාර සමාගම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම - www.oriental.lk



වර්තමාන ධර්මශාස්ත්‍රොද්දීප්තියෙහි ස්ථාවරත්වය ඇති කිරීමට මෙම කරුණු අතිශයින් උපකාරවත් විය. ප්‍රාචීන භාෂොපකාර සමාගම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද සහයෝගය ඇතුව ආරම්භ කළ විභාග ක්‍රමය ප්‍රාචීන භාෂා සාහිත්‍යයන්ගේ හා ඉතිහාස පුරාවිද්‍යා තර්ක න්‍යාය ජ්‍යොතිෂය ආයුර්වේදය ආදි වෙනත් විෂයයන්ගේ ද ප්‍රවීණත්වයක් ඇති ගිහි පැවිදි උගතුන් බිහි කිරීමට ඉවහල් විය. ධර්ම ශාස්ත්‍රඥනය මෙන් ම සදාචාරය හා ආධ්‍යාත්මික සංවර්ධනය ද පිරිවෙන් අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය විය. පිරිවෙන් ගුරුවරයාගේ යුතුකම වූයේ ශාස්ත්‍රඥනය ලබා දීම පමණක් නො වේ. ශිෂ්‍යයාගේ සදාචාරය හා ආධ්‍යාත්මික චරිත වර්ධනය ද ඔහු සතු වගකීමක් විය. සදාචාරයෙන් තොර අධ්‍යාපනය නිෂ්ඵල වූවක් ලෙස සැලකිණ. මේ නිසා පිරිවෙන් අධ්‍යාපනයෙන් පෝෂණය වූ පරිපූර්ණ පාණ්ඩිත්‍යයෙකින් හෙබි ආදර්ශවත් උත්තම චරිතයකින් යුත් සම්බුද්ධ ශාසනයටත් බෞද්ධ සමාජයටත් ශාස්ත්‍රීය ලෝකයටත් අතිශයින් වැඩදායක ගිහි පැවිදි උගත් පිරිසක් පහළ වූහ. බෞද්ධ ලෝකයාට අවශ්‍ය ධර්මෝපදේශ දෙමින්, ආගමික කටයුතු ඉටු කරමින් ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර දියුණුවට අවශ්‍ය ශාස්ත්‍රීය ග්‍රන්ථ සංශෝධනය හා ග්‍රන්ථ සම්පාදනය කරමින් එම උගතුන් ඉටු කළ සේවාව මෙතෙකැයි පමණ කළ නොහැකිය.

රටක අධ්‍යාපන ක්‍රමය කාලීන වසයෙන් සංස්කරණයන්ට භාජන වීම නොවැළැක්විය හැකිය. සමාජ පරිවර්තනය සමග අධ්‍යාපනයේ ද වෙනස්කම් ඇති වේ. ආගමික සංස්කෘතික කාර්මික හා දේශපාලනික වෙනස්කම් කරණකොටගෙන සමාජ තත්වයේ වෙනස්කම් ඇති විය හැකිය. මෙම වෙනස්වීම් කිසිවකුට නතර කළ නො හැකිය.

වර්තමාන සමාජයට ප්‍රයෝජනවත් සේවාවක් කිරීමට බලාපොරොත්තු වන කවුරුන් විසින් වුව ද සමාජයෙහි යථාස්වරූපය වටහා ගත යුතුය, කාලීන අධ්‍යාපනයක් ලැබිය යුතුය. භික්ෂූන් වහන්සේ පිළිබඳව ද මෙම න්‍යායය මෙසේ ම නොවෙනස්ව පවතී. එහෙත් මෙහිලා අප විසින් අමතක නොකළයුතු වැදගත් කරුණක් නම් ලක්දිව ථෙරවාදී භික්ෂූන් වහන්සේට ආවේණික බුද්ධධර්මය ප්‍රමුඛ කොට ඇති ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර අධ්‍යයනය බැහැර කොට නවීන විවිධ විෂයයන් හා භාෂා ශාස්ත්‍ර අධ්‍යයනය පමණක් යෝග්‍ය නොවන බවය.

අතීතයේ භික්ෂූන් වහන්සේගෙන් ඉටු වූ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඉමහත්ය. එයට ප්‍රධාන හේතුව එම යුගයට අවශ්‍ය පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට භික්ෂූන් වහන්සේට හැකිවීමය. අද අප ජීවත්වන්නේ ජාත්‍යන්තර වසයෙන් ප්‍රබල සම්බන්ධතා ඇති ලෝකයකය. මෙම තත්ත්වයට නොබියව මුහුණ දිය හැකි අන්දමට භික්ෂු අධ්‍යාපනය ද ප්‍රාචීන භාෂාශාස්ත්‍ර මුල් කොට නවීන භාෂා ශාස්ත්‍ර පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් ලැබෙන පරිදි සකස් විය යුතුය.

ප්‍රාචීන භාෂොපකාර සමාගමේ මෙවර ශාස්ත්‍රීය සංග්‍රහය පිරිවෙන් අධ්‍යාපනය හා සම්බන්ධ විවිධ මාතෘකා යටතේ ලක්දිව සම්භාවනීය ගිහි පැවිදි උගතුන් විසින් සම්පාදිත ලෙඛන මාලාවකින් යුක්තව පළ කිරීමෙන් අප බලාපොරොත්තු වනුයේ පිරිවෙන් අධ්‍යාපනයේ නව යුගයක් උදා කිරීමට අවශ්‍ය පෙර වදනක් සැපයීමය.

**සංස්කාරක මණ්ඩලය**